# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2133/42 – 2019 ජූලි 25 වැනි බ්‍රහස්පතින්දා – 2019.07.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දකුණු ගිරුවා පත්තුව සුළු කොට්ඨාසයේ, නාකුළුගමුව (අ.ග.පි. 302) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක එච්/බීඑල්ජ්/2018/154 හා 2018.06.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – කොස්වත්ත නොහොත් සියඹලාගස්ආර, දංගහවත්ත නොහොත් සිද්දියාගේ වත්ත – ප්‍රමාණය: හෙක්. 0.2023ක් පමණ**

උතුරට: කේ. එච්. පියදාස හිමිකම් කියන වෙරළාව්විගෙවත්ත, කේ. එච්. අසේල සමන්ත හිමිකම් කියන කිරිකොස්ගහහේන සහ ඒ. උබයසේන හිමිකම් කියන කිරිකොස්ගහහේන; නැගෙනහිරට: කේ. එච්. අසේල සමන්ත හිමිකම් කියන කිරිකොස්ගහහේන සහ ඒ. උබයසේන හිමිකම් කියන කිරිකොස්ගහහේන, මාර්ගය සහ තිස්ස වීරතුංග හිමිකම් කියන කොස්වත්ත නොහොත් සියඹලාගස්ආර, දංගහවත්ත නොහොත් සිද්ධියාගේවත්ත; දකුණට: තිස්ස වීරතුංග හිමිකම් කියන කොස්වත්ත නොහොත් සියඹලාගස්ආර, දංගහවත්ත නොහොත් සිද්ධියාගේවත්ත; බටහිරට: කේ. එච්. පියදස හිමිකම් කියන වෙරළාව්විගෙවත්ත, කේ. එච්. අසේල සමන්ත හිමිකම් කියන කිරිකොස්ගහහේන සහ ඒ. උබයසේන හිමිකම් කියයන කිරිකොස්ගහහේන.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/ඩබ්ලිව්එස්/542.
2019 මැයි මස 09 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 347